# ළිපිනයක් නැති නිවසක්



විතුල්‍යා උදාන්දි කුලප්පුආරච්චි

# ලිපිනයක් නැති නිවසක්

විතුල්යා උදාන්දි කුලප්පුආරච්චි
කතෘ

මහාමායා බාලිකා විදුහල - මහනුවර
10 වසර (2024)

වෙනත් කෘති My Imaginations – 2023
(ISBN- 978-624-97040-0-8)
ප්‍රකාශිත දිනය 2025-02-08

**ISBN 978-624-208-794-8**

# පිදුම

මහාමායාවේ විදුහල්පතිතුමිය ඇතුළු පන්තිභාර ගුරුතුමියටත් ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් ගුරුතුමාටත් සියලුම සංවිධානය මණ්ඩලයේ ගුරුමහත්මීන්ටත් ලබාදුන් නොසැලෙන සහයෝගය සහ මගපෙන්වීමත් වෙනුවෙන් ගෞරවනීය ස්තූතිය.

විස්මිත දෑ සොයා යන අත්භූත අත්දැකීම් විඳීමට කැමති සුවහසක් පාඨකයින්වෙත පුදකරමි.

නව චින්තාවලියකට වෙර දරන මාගේ
යෙහෙළියන්ට ආදරයෙන් පුද කරමි



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය හික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

**සාරා කෙම්** යනු ඉතා දක්ෂ ගවේෂකවරියක්. ඇය පසුගිය මාස කීපයේම ඉතා අබලන් වූ ඉගි පසුපස හඹා ගියාය.



දිනක් ඇය විවේකීව සටින විට ඇයගේ සුරතල් පුස් පැටියා යම් ශබ්දයක් ඇසී නිවසේ ගබඩා කාමරය වෙත දුව යන අයුරු දැක ඇය ඒ පසුපස ගියාය. පූස් පැටවා සතෙකු පස පස පන්නා ගබඩා කාමරයේ සියල්ලම පෙරලමින් ඒ මේ අත දිව ගියාය. පූසාගේ කලබලයට ගබඩාවේ තිබුණු පෙට්ටියක් පෙරලී එහි තිබූ දෑ පොලවට පෙරලුනේය.

පෙට්ටිය ඇවිස්සූ ඇයට අමුතුම ලිපියක් ලැබුණේය. එය දශක ගණනාවකට පෙර ලියා ඇති බවක් දැණුන අතර ඉතාම කුතුහලයෙන් අතට ගත් සාරා එම ස්ථානයේම බිම හිදගෙන ලිපිය කියවීමට සිතුවේය.



එහි ආපසු යැවීමට ලිපිනයක් නොතිබුණි. සාරා ලිපිය සිඹ බැලුවේ අමුතුම පැරණි සුවඳක් දැනුන නිසයි. එහි ඇතුළත පණිවිඩය කෙටිය. එය දුටු සාරා පුදුම විය. එහි තිබුණේ

**“ඔබව සොයා ගැනීමට පෙර**

**ඔබ නිවස සොයා ගන්න”**

ලෙසයි. ඊට අමතරව එහි කිසිදු පැහැදිලි කිරීමක් නොතිබුණි.



තව ද නගරයේ දුරස්ථ ප්‍රදේශයකට මග පෙන්වන නොපැහැදිලි දිශාවන් සමූහයක් සහිත කිසිදු වාර්තාවක නොදුටු අපහැදලි සිතියමක් ද විය. විගසින් දුරකථනය ගත් සාරා ගූගල් සිතියම සොයන්නට විය. චන්ද්‍රිකා රූප වල පවා එම ප්‍රදේශයේ කිසිවක් නොපෙන්වන්නට විය.



ඇය එදින රාත්‍රියේ දී සිතුවේ මෙය සොයා ගන්නා අයුරුයි. ඇයගේ ගවේෂක ජීවිතයෙන් ප්‍රයෝජනයක් ගැනීමට සිතූ සාරා අවසානයේ තීරණය කලේ උදෑසනම ලිපිනයක් නැති නිවස සොයා යාමට පිටත්විය යුතු බවයි.

මිනිසුන්ගෙන් විමසුවද කිසිම හෝඩුවාවක් නොලැබුනු ඇය උත්සාහය අත් නොහලාය. එදින උදෑසන සිට තද අවු රශ්මිය තිබූ අතර දින ගණනක වෙහෙසත් සමග අසල තිබූ ගසක් ලග වාඩි විය. හමා එන උණුසුම් සුළඟට දහඩිය දැම්මද වැඩි විය. ඇය පවන් ගැසීමට සිතා සිතියම අතට ගත්තේය.



නමුත් ඊට පෙර නැවතත් සිතියම පිරීක්සීම සඳහා හිස පහළට කර එය දිගහැර බැලුවාය. එවිට හිස මුදුනේ සිට ගලා ආ දහඩිය බිංදුවක් සිතියම මත පතිත විය. එක්වරම සිතියම වෙනස් වන්නට පටන් ගැනුනි. අපහැදිලි මාර්ග හා බොඳ වූ සලකුණු ටිකෙන් ටික පෙනෙන්නට විය. ඒත් සමගම වට පිට බැලූ සාරාට තමන් අසල තිබූ මාවතම සිතියමේ දිස් වූ බව තේරුම් විය. ඇයට ඉක්මනින් ඉදිරියට යා යුතු බව සිතුනි. එම මොහොතේ සිතේ සතුටත් සමග තිගැස්සීමකුත් ඇති විය. වහා එතැනින් පිටත් වූ සාරා ඉදිරියෙම තිබූ මාර්ගයට පිවිසියේය.



එය ඉතා දුෂ්කර ගමක පටු වූ වංගු සහිත මාර්ගයකි. එහි ගමන්ගත් සාරාට කෙලවරේ මීදුමෙන් වැසී ගිය පෙදෙසක ජරාවට පත් වූ පැරණි නිවසක් දිස් විය.

සෙමෙන් සෙමෙන් නිවස වෙත ලගා වූ සාරා අමුතුම පඩිපෙළක් පසුකර පැරණි වික්ටෝරියා ව්‍යුහයක් වැනි අඳුරු වියලී ගිය තීන්ත ගැලවී තිබූ ජනේලය තුළින් ඇතුළත බැලිය. එහි යම් ජීවමාන බවක් ඇයට දැනෙන්නට විය.



සාරා ආලින්දයට පා තබන විටම ඇගේ බරට යටින් ලී පවුරු කෙඳිරිගාමින් හඬ නැගුණි. ඉදිරිපස දොර අගුළු හැර තිබුණේ ඇයට ඇතුළට ආරාධනා කරන්නාක් මෙනි. ඇතුළත දුවිලි හා මකුළු දැල් පිරුණු අතර වෙනත් ඝන දෙයක් ඇය දෙස බලා සිටින බවක් දැනුනි. සිත තුළ තරමක් බිය දැනුනද සිතට ධෛර්යය ගත් සාරා ඉදිරියට ඇදෙන්නට විය.

දිරා ගිය රාක්කයක ඒ මේ අත හරවා තිබූ පොත් සමූහයක් ඇයගේ නෙතට දිස් විය. පොත් වල පවා නොතිබිය යුතු සියවස් ගණනාවක් තිස්සේ මෙම නිවසේ ජීවත් වූ මිනිසුන්ගේ දිනපොත් රාශියක් එක් කල අධ්‍යයනයක් ඇයට හමුවිය. සමහරක් පිටු ඉරා දමා තිබුණත් කිපයක් වේයන්ගේ ආහාරය වී තිබුණි.



එක් සගරාවක් වැනි පොතක් ඇයට එකපාරටම දිස් විය. එය මුණින් පෙරළා තිබූ නිසා සගරාව අතට ගත් සාරා පිටකවරය හරවා බැලුවේය. එහි තිබූ දෙය දැක ඇගේ හදවත නතර වන්නා සේ දැනෙන්නට විය.



“සාරා කෙමී”

ඒ ඇගේ නමයි. ඇය පොත විවර කරන විට දෑත් වෙව්ලමින් ගැහෙන්නට විය“

එහි පළමු පිටුවේ තිබුනේ

“නිවසේ රහස”
යනුවෙනි.



එහි පෙර දින නියම කර තිබූ සියළුම විස්තර ඇතුලත් විය.
ඇය කල දේ හරියටම විස්තර කර තිබුණි. ලිපිය ලැබුණු අයුරු ද නිවස සොයා ගැනීම ද ඇය නිවස තුළට පැමිණි ආකාරය ද එහි සටහන් විය.
එසේම මින්පසු ඉදිරියට වෙන්නට යන දේ ද එහි විස්තර විය.

**"ඔබට උඩුමහලේ අඩි ශබ්දයක් ඇසෙනු ඇත. ඒවා අනුගමනය නොකරන්න. ඔබ එසේ කරන මොහොතේ ඔබ නිවසේ කොටසක් වනු ඇත."**



මෙසේ එම පොතේ සටහන්ව තිබුණාත් සමග ඉහළින් ශබ්දයක් දෝංකාර දුන්නේය. ඉතාම මන්දගාමී හිතාමතාම තබන අඩි සලකුණු ඇසීමත් සමග සාරාගේ හුස්ම හිරවන්නාසේ දැනුනි. ඇය විගසින් පොතේ ඊලග පිටුව දෙස බැලුවේය. වචන වෙනස් වී තිබුණේය.

"ඔයා දැනටමත් පරක්කු වැඩි"

සාරාගේ හදවත හැහෙන්නට විය. කෑගැසුව ද මුවින් ශබ්දය පිටනොවුනි. වාතය අයිස් මෙන් සීතල විය.



ඉහළින් ඇසුන ශබ්දය ලග ලගම එන බව දැනුනි. එක්වරම සෙවනැල්ලක් ඇයගේ ඇග මතට පැන්නේය. ඇය කෑ ගැසූ නමුත් මුවින් ශබ්දය එය ඇග හරහා කොරිඩෝ වේ සෙවනැල්ලක් මෙන් පිටත් විය. සාරා දුව ගොස් දොර ඇරීමට බැලූ විට එය නොහැකි විය. ඇය නිවසේ වටපිට බැලුවේ ජනේලයකින් හෝ එළියට පණින්න සිතාය.

ටික වේලාවකින් දොර විවෘත කිරීමට එම ස්ථානයේ නොතිබුනේය. නිවස ඇය වටා වැසී තිබුණේය. සාරා දැඩිවම සිතුවේ කෙසේ හෝ එතැනින් පිටවන බවයි.



එකවරම නිවසේ බිත්ති කෙදිරි ගෑවාය. බිත්තිය ජීවමාන දෙයක් මෙන් ස්පන්දනය වන බවක් පෙනෙන්නට විය.

ඇය අත තිබුණු දිනපොතේ ඉන්පසු කුමක් තිබේදැයි කියා ඉක්මණින් පෙරළා බැලුවේය.



"පිටවීමට ඇත්තේ එක් මාර්ගයක් පමණී"

තීන්ත තවමත් තෙත් වූ බිත්ති දිගේ අස්වභාවික ලෙස සෙවනැලි විහිදවා තිබුණි.
වාතය හරහා කෙදිරිගාමින් එක් හඬක් ඇසුනි. ඒ සමගම සාරා කුමක් හෝ සිදුවිය යුතුයි සිතා දිනපොත ගෙන ඉරා දැමුවේය. එවිට දිගම දිග කොරිඩෝවක් ඇයට දක්නට හැකි විය. ඇය එය දිගේ දිව ගියාය. දුව යන අතරතුර ඇය දුටුවේ බිත්ති ඔරලෝසුව ඇය දෙස බලා සිටින බවයි.



තව තවත් ඒ දෙස නොබලාම දිව ගිය සාරාට ඈතින් කෙළවරක ඉතා අලංකාර කුඩා දොරටුවක් දිස්විය.



ඇය ඉතා විගසින් ඒ වෙත ලන් විය. එළිපත්ත තරණය කළ මොහොතේම ඇය නිවසටම පැමිණි අතර ලෝකය වෙනස් වී තිබුණි.

සාරා හිරකරමින් තිබූ හුස්ම සැහැල්ලුවෙන් ගත්තේය. සිතට ඉතා සතුටක් දැණුනි. අත තිබූ පොත ද ලිපිය ද සිතියම ද අතුරුදන් වී තිබුණි. සිදු වූ කිසිවක් සාරාට සිතාගත නොහැකි විය.



මද වේලාවකට පසු ඇය උණු තේ පා කෝප්පයක් සදා ගෙන මිදුලේ සිමෙන්තියෙන් සාදා තිබූ පුටුවේ වාඩි වී කල්පනා කරන්නට විය. පුස් පැටියාද පුරු පුරු ගාමින් ලගට තුරුලු විය.

සාරාගේ දුරකථනයට විද්‍යුත් පණිවුඩයක් ලැබුණි. එහි එවූ අයෙකු සඳහන් නොවීය.

**"ඔබ ගිය නමුත් නිවස කිසිදා ගියේ නැත. මුළු පිරිසක් පාලනය කල මහා රජු ගේ මාලිගය ඔබ අතින් නිර්මාණය වූවකි.  සැමදා රජු රැක්ක ගෞරවයට ඔබට කැදවීමක් හිමිය. නිති කැඩූ විනය ගරුක නොවූ පිරිස අදුරු කවුළුවේ බිත්ති මත හැඩූ කදුලෙන්  පරාවර්තනය වෙමින් සිටී."**




ලෙස එහි සදහන් විය.

සාරාගේ නෙත් කදුලින් පිරී ගියේය. ජීවිතය මහා පුදුම කඩයිම් පසුකර ඇය පැමිණි එකක් යැයි වැටහුණි.



සසර ගමනේ කාලය හරහා ලිපිනයක් නොමැති නිවසක් වෙත අතීතයට මොහොතක් සැබෑවට ගිය ගමනක් යැයි ඇයට වැටහුණි.

මෙය ගවේෂකවරියක්ව ලැබූ ඇමුතුම අත්දැකීමක් බව ඇයට දැනුනේය.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-794-8